සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්** **08 S I,II**

**(නව නිර්දේශය)**

(පැ තුනයි)

**2018.12.26 /08.30 - 11.40** **(08) සමාජ විද්‍යාව - I, II** අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව - I පත්‍රය

සැලකිය යුතුයි :

- ✻ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ✻ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✻ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- ✻ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

1. 'සමාජ විද්‍යාව යනු සමාජ සංස්ථා පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විද්‍යාවයි' යනුවෙන් සමාජ විද්‍යාව නිර්වචනය කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා කවු ද?
   (1) එමිල් ඩුර්කයිම් (2) ඔගස්ට් කොම්ට්
   (3) හර්බට් ස්පෙන්සර් (4) මැක්ස් වේබර්

2. සමාජීය විද්‍යා විෂය කාණ්ඩයට අයත් විෂයයන් පමණක් ඇතුළත් වන පිළිතුර කුමක් ද?
   (1) සමාජ විද්‍යාව, ජීව විද්‍යාව, දේශපාලන විද්‍යාව
   (2) පරිසර විද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව
   (3) මනෝ විද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව
   (4) දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව

3. සමාජ විද්‍යාඥයින් සිව්දෙනකුගේ නම් 'අ' තීරුවේ ද ඔවුන් සමාජ විද්‍යාවේ සංවර්ධනයට දක්වන ලද දායකත්වය 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ඔගස්ට් කොම්ට් | A – පළමු වතාවට සමාජ විද්‍යාවට පර්යේෂණ ක්‍රමයක් හඳුන්වා දීම |
| 2. එමිල් ඩුර්කයිම් | B – සමාජය විද්‍යාත්මකව තේරුම් ගැනීම සඳහා සමාජ ස්ථිතිකත්වය හා සමාජ ගතිකත්වය හැදෑරිය යුතු බව පෙන්වා දීම |
| 3. මැක්ස් වේබර් | C – සමාජ පරිණාමය තේරුම් ගැනීමේ දී පන්ති ගැටුම්වල ඉතිහාසය හැදෑරීමේ වැදගත්කම පෙන්වා දීම |
| 4. කාල් මාක්ස් | D – සමාජය තේරුම් ගැනීමේ පදනම සමාජ ක්‍රියාව අධ්‍යයනය කිරීම බව පෙන්වා දීම |

   ඉහත 'අ' තීරුවේ නම් 'ආ' තීරුවට අනුපිළිවෙළින් නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
   (1) *A, B, C, D* (2) *A, C, D, B* (3) *B, A, C, D* (4) *B, A, D, C*

4. සමාජ පැවැත්ම තහවුරු වීම සඳහා සමාජ අන්තර් සම්බන්ධතාවේ වැදගත්කම දක්වා ඇති බෞද්ධ සූත්‍රය වන්නේ,
   (1) කාලාම සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
   (3) චූල්ල හත්ථි පදෝපම සූත්‍රයයි. (4) අග්ගඤ්ඤ සූත්‍රයයි.

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **5** සහ **6** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කරගන්න.

*A* – ආරෝපිත තත්ත්වය ප්‍රධාන වීම
*B* – පෞද්ගලික අරමුණු මුල්කොට ගෙන ක්‍රියා කිරීම
*C* – අපි යන හැඟීමෙන් ක්‍රියා කිරීම
*D* – සාධිත තත්ත්වය ප්‍රධාන වීම
*E* – නෛතික සමාජ පාලනයක් පැවතීම
*F* – සමාජ සම්බන්ධතා මාර්ගයෙන් සමාජය පාලනය වීම

5. යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජයක ලක්ෂණ දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) *A, B, C* (2) *A, D, F* (3) *A, C, F* (4) *C, D, E*

6. ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජයක ලක්ෂණ දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) *A, C, F* (2) *B, C, D* (3) *C, D, E* (4) *B, D, E*

● අංක **7** සහ **8** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ උපයෝගී කරගන්න.

*A* – කෘෂිකර්මය මුල්කරගත් ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවතීම
*B* – මහා පරිමාණ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් කොටු කර ගැනීම නිසා ග්‍රාමීය ප්‍රදේශවල ඉඩම් හිඟයක් ඇති විය
*C* – ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පැවතීම
*D* – සිරිත් විරිත් මුල්කරගත් සමාජ පාලනයක් පැවතීම
*E* – ආගම, කුලය හා සම්ප්‍රදාය මුල්කර ගෙන සමාජ සම්බන්ධතා තීරණය වේ.
*F* – ගිවිසුම් මත පදනම් වූ නෛතික සම්බන්ධතා ඇතිවීම

7. ඉහත ප්‍රකාශ අතුරින් ප්‍රාථමික සමාජයක ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) *A, B, D* (2) *A, D, E* (3) *B, D, E* (4) *B, E, F*

8. නූතන සමාජයක ලක්ෂණ පමණක් සඳහන් ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) *A, B, F* (2) *B, C, F* (3) *C, D, E* (4) *D, E, F*

● යහපත් සමාජ වෙනසක් ඇති කිරීම සඳහා සාමාජිකයා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් පහත දැක්වේ.

1. උත්සාහයෙන් කටයුතු කිරීම
2. යහපත් ක්‍රියාමාර්ග මගින් තම ධනය ආරක්ෂා කර ගැනීම
3. උසස් ගුණ දහම් ඇති මිතුරන් ඇසුරු කිරීම
4. සරල, සැහැල්ලු හා අහිංසාවාදී ජීවිතයක් ගත කිරීම

09. ඉහත ක්‍රියාමාර්ග දැක්වෙන බෞද්ධ සූත්‍ර ධර්මය කුමක් ද?
(1) වසල සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (4) කූටදන්ත සූත්‍රය

10. "ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම හා ධනවාදයේ හරය" යන කෘතිය මගින් සමාජ නවීකරණය කෙරෙහි ආගමික සාධක බලපාන බව පෙන්වා දෙනු ලැබුවේ,
(1) මාටින් ලූතර් විසිනි. (2) විල්බට් මුවර් විසිනි.
(3) ජොන් කැල්වින් විසිනි. (4) මැක්ස් වේබර් විසිනි.

● පහත දැක්වෙන ලක්ෂණ අධ්‍යයනය කරන්න.

✻ මුදල් මත පදනම් වූ වෙළෙඳපොළ ආර්ථිකයක් පැවතීම
✻ බාහිර සාටෝපකාරී ජනප්‍රිය ලක්ෂණවලට මූලිකත්වය ලබා දීම
✻ භාෂා කිහිපයක් සම්මිශ්‍රණය වූ භාෂාවක් භාවිත කිරීම
✻ සංකීර්ණ පන්ති ක්‍රමයක් පැවතීම

11. ඉහත සඳහන් ලක්ෂණ බහුලව දක්නට ලැබෙන්නේ කුමන සමාජ ක්‍රමයක් තුළ ද?
(1) ග්‍රාමීය සමාජය (2) ප්‍රාථමික සමාජය
(3) අර්ධ නාගරික සමාජය (4) නාගරික සමාජය

[ 3 වැනි පිටුව බලන්න.

12. ප්‍රාථමික කොමියුනිස්ට් අවධියේ සිට සුපිරි කොමියුනිස්ට් අවධිය දක්වා අදියර හයක් ඔස්සේ සමාජය පරිණාමය වන බව දැක්වූ සමාජ විද්‍යාඥයා කවු ද?
    (1) කාල් මාක්ස් (2) හර්බට් ස්පෙන්සර් (3) මැක්ස් වේබර් (4) ඔගස්ට් කොම්ට්

- පහත සඳහන් ලක්ෂණ හොඳින් අධ්‍යයනය කරන්න.
  - ✳ පැහැදිලිව ගොඩනඟා ගත් අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ.
  - ✳ හොඳින් සංවිධානය වූ පැහැදිලි නායකත්වයක් දක්නට ඇත.
  - ✳ සමාජ අසාධාරණයට විරුද්ධව උද්ඝෝෂණය කරයි.
  - ✳ සමාජයට මඟ පෙන්වමින් පාලක පක්ෂයට බලපෑම් කරයි.

13. ඉහත සියලු ම ලක්ෂණවලින් සමන්විත කෙටිකාලීන සමාජ වෙනස් කිරීමේ ව්‍යාපාරය වන්නේ,
    (1) දේශපාලන විරෝධතා ව්‍යාපාරයයි. (2) සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාරයයි.
    (3) ප්‍රචාරණ ව්‍යාපාරයයි. (4) මෝස්තර ව්‍යාපාරයයි.

- දුප්පත් රටක් සංවර්ධනය වූ රටක් දක්වා වෙනස් කිරීමේ දී සොරකම, දූෂණය වැනි අපරාධ නැති කිරීම සඳහා,
  - ✳ වෙළෙඳාම් කරනු කැමති අයට මූල ධනය සැපයීම
  - ✳ ගොවිතැන් කරනු කැමති අය සඳහා ජල පහසුකම්, බීජ හා ඉඩම් ලබාදීම

  මගින් රාජ්‍ය පාලකයා රටේ ජනතාවගේ දුප්පත්කම නැති කිරීමට ක්‍රියා කළ යුතු ය.

14. ඉහත ඉගැන්වීම් ඇතුළත් බෞද්ධ සූත්‍රය වන්නේ,
    (1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) කූටදන්ත සූත්‍රයයි.
    (3) මහා මංගල සූත්‍රයයි. (4) චූල්ලහත්ථි පදෝපම සූත්‍රයයි.

15. 'සංස්කෘතික ගැටුම' යනුවෙන් අදහස් වන්නේ,
    (1) සංස්කෘති දෙකක් හෝ කිහිපයක් අතර ගැටුමයි.
    (2) ආගම් අතර ගැටුමයි.
    (3) පරම්පරා ගැටුමයි.
    (4) ජාතීන් දෙකක් අතර බලය පිළිබඳ ගැටුමයි.

16. ජනවර්ගයක් යන්නෙන් අදහස් වන්නේ,
    (1) පොදු සංස්කෘතියක් මත පදනම් වූ ජන සමූහයකි.
    (2) එක් භාෂාවක් කතා කරන ජන සමාජයකි.
    (3) එක් භූගෝලීය කලාපයක් ජනාවාස කරගත් ජන සමූහයකි.
    (4) සමාන ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු ජන කණ්ඩායමකි.

17. සංස්කෘතිය නිර්මාණය වන්නේ,
    (1) අව් වැසි, සුළං වැනි ස්වභාවධර්මයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ය.
    (2) ඒ ඒ ප්‍රදේශවලට අයත් දෙවිවරුන්ගේ මඟ පෙන්වීම යටතේ ය.
    (3) විවිධ ආගම්වල දේශනාවලට අනුව ය.
    (4) මනුෂ්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ය.

18. 'සංස්කෘතික ලැග්ම' යන්නෙන් අදහස් වන්නේ,
    (1) සංස්කෘතියේ වේගවත් වෙනස්වීමයි.
    (2) භෞතික සංස්කෘතියේ වන වෙනස්වීමට සාපේක්ෂව අභෞතික සංස්කෘතිය වෙනස්වීම ප්‍රමාද වීමයි.
    (3) සංස්කෘතික හර පද්ධතිය සෝදාපාලුවට ලක්වීමයි.
    (4) සාමාජිකයා විසින් සංස්කෘතිය නොසලකා හැරීමයි.

19. ජන සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකාවේ ජනවර්ග අනුපිළිවෙළට පෙළගැස් වූ විට නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් (2) සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්
    (3) සිංහල, මුස්ලිම්, දෙමළ, මැලේ (4) සිංහල, මුස්ලිම්, මැලේ, දෙමළ

[ 4 වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
  - *A* – වාරිකර්මාන්තය මත පදනම් වූ යහපත් කෘෂිකාර්මික ආර්ථික රටාවක් පැවතීම
  - *B* – ආත්මාර්ථය මූලික කරගත් පවුල් සංවිධාන රටාවක් පැවතීම
  - *C* – දළදා වහන්සේ රාජ්‍ය සංකේතය ලෙස පිළිගත් දේශපාලන ක්‍රමයක් පැවතීම
  - *D* – අටලෝ දහමින් අකම්පිත ජන විඥානයක් තිබීම

20. මේවා අතුරින් බුදු දහමේ ආභාසය නිසා මෙරට ජන සමාජය තුළ ස්ථාපිත වූ කරුණු ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?

    (1) *A, B* හා *C* (2) *A, C* හා *D* (3) *A, B* හා *D* (4) *B, C* හා *D*

21. සමාජ පාලනයට අදාළ දේවධර්මය හෙවත් හිරි ඔත්තප්ප යන්නෙහි නිවැරදි අදහස වන්නේ,
    (1) සමාජයට මුහුණදීමේ ලැජ්ජාව හා බයයි.
    (2) කුසලයට ඇති ලැජ්ජාව හා බයයි.
    (3) පවට ඇති ලැජ්ජාව හා පවේ විපාකයට ඇති බයයි.
    (4) ලැජ්ජාව හා බයයි.

- චරිත සංවර්ධනය කිරීමෙහිලා උපයෝගී කර ගත හැකි ජාතක කතා කිහිපයක් 'අ' තීරුවේ ද ඒවායින් කියවෙන මූලික හරයන් 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. උම්මග්ග ජාතකය | *A* – පති භක්තිය රැකගැනීමේ වටිනාකම |
| 2. සම්බුලා ජාතකය | *B* – දාන පාරමිතාවේ උපයෝගීතාව |
| 3. වෙස්සන්තර ජාතකය | *C* – ප්‍රඥාවන්ත වීමෙහි වටිනාකම |
| 4. කුස ජාතකය | *D* – ප්‍රතිපත්තිගරුකභාවයේ අගය |

22. ඉහත 'අ' තීරුවේ ජාතක කතා 'ආ' තීරුවේ මූලික හරයන් සමග ගැලපූ විට වඩාත්ම නිවැරදි පිළිතුර වන්නේ,

    (1) *A, B, C* සහ *D* ය. (2) *B, A, D* සහ *C* ය. (3) *C, A, B* සහ *D* ය. (4) *D, B, C* සහ *A* ය.

23. මානව වර්ගයාගේ ආරම්භයත් සමග තෘෂ්ණාව මුල් කරගෙන ක්‍රමයෙන් වර්ධනය වූ සොරකම, ප්‍රජා ඝාතනය ආදී අර්බුද නිරාකරණය සඳහා 'මහා සම්මත' නමින් පාලකයකු තෝරා පත්කර ගත් බව සඳහන් වන බෞද්ධ සූත්‍රය කුමක් ද?

    (1) අග්ගඤ්ඤ සූත්‍රය (2) ආධිපත්‍යය සූත්‍රය
    (3) වසල සූත්‍රය (4) ඉන්ද්‍රික සූත්‍රය

24. ඉස්ලාමික සිරිත් විරිත් කෙරෙහි පදනම් වූ ප්‍රධාන ඉගැන්වීම් හතර අතුරින් 'සකාතය' යන්නෙන් අදහස් වන්නේ,
    (1) නිරතුරුව ම ප්‍රණාමයේ යෙදීමයි.
    (2) ඇති හැකි අය විසින් නැති බැරි අය වෙනුවෙන් කරනු ලබන අනිවාර්ය දන්දීමයි.
    (3) මක්කම වන්දනාවේ යෙදීමයි.
    (4) රාමලාන් මාසය තුළ දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීමයි.

- පහත දැක්වෙන ප්‍රකාශ සැලකිල්ලට ගන්න.
  - *A* – ප්‍රාණඝාතය නොකරව
  - *B* – අදත්තාදානය නොකරව
  - *C* – රූප වන්දනා කරව
  - *D* – කාමයෙහි වරදවා නොහැසිරෙව

25. ඉහත ප්‍රකාශ අතුරින් කතෝලික ආගමේ සමාජ පාලනය කෙරෙහි මගපෙන්වන 'දස පනතෙහි' අන්තර්ගත ඉගැන්වීම් පමණක් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?

    (1) *A, B* හා *C* (2) *A, B* හා *D* (3) *A, C* හා *D* (4) *B, C* හා *D*

26. "යමෙකු තුළ ශරීරයෙහි, සිතෙහි සහ අධ්‍යාත්මයෙහි ඇති හොඳම දෙය පිටතට ඇද ගැනීම, අධ්‍යාපනය" ලෙස පෙන්වා දෙනු ලැබුවේ,
   (1) අනගාරික ධර්මපාල තුමා ය.
   (2) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
   (3) ආරුමුග නාවලර් තුමා ය.
   (4) මහත්මා ගාන්ධි තුමා ය.

● ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමයට අයත් අධිකරණ කිහිපයක් 'අ' තීරුවේ ද අධිකරණ සතු බලතල කිහිපයක් 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
| --- | --- |
| 1. ශ්‍රේෂ්ඨාධිකරණය | *A* – සියලු ම අපරාධ පිළිබඳ අධිකරණ බලය |
| 2. මහාධිකරණය | *B* – අවසාන අභියාචනා අධිකරණ බලය |
| 3. පළාත්බද මහාධිකරණය | *C* – සිවිල් නඩු විසඳීමේ බලය |
| 4. දිසා අධිකරණය | *D* – පළාත් සභාව තුළ රිට් ආඥා නිකුත් කිරීමේ බලය |

27. ඉහත 'අ' තීරුවේ සඳහන් අධිකරණ සමග 'ආ' තීරුවේ සඳහන් අධිකරණ බලතල පිළිවෙළින් ගැළපූ විට වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?
   (1) *A, B, C* සහ *D*
   (2) *A, C, B* සහ *D*
   (3) *B, A, C* සහ *D*
   (4) *B, A, D* සහ *C*

28. සමාජ පාලනය සඳහා පොලීසිය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරය වන්නේ,
   (1) නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි.
   (2) අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමයි.
   (3) රථවාහන නිසි පිරිදි පාලනය කිරීමයි.
   (4) වැරදිකරුවන් අත්අඩංගුවට ගැනීමයි.

29. වයස අවුරුදු 16-21 දක්වා තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය සඳහා පිහිටුවා ඇති ආයතනය වන්නේ,
   (1) රක්ෂිත බන්ධනාගාරයයි.
   (2) තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයයි.
   (3) තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයයි.
   (4) බන්ධනාගාරයයි.

30. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය හා පළිගැනීම දුරස්කර ස්වයං පාලනය ඇතිකර ගැනීම සඳහා වඩාත් ම සුදුසු භාවනාව වන්නේ,
   (1) මෛත්තානුස්සති භාවනාවයි.
   (2) බුද්ධානුස්සති භාවනාවයි.
   (3) මරණානුස්සති භාවනාවයි.
   (4) අසුභානුස්සති භාවනාවයි.

● පහත දැක්වෙන *A, B, C* සහ *D* සිද්ධි යුගල අධ්‍යයනය කර අංක **31** සහ **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*A* – (i) ප්‍රාණඝාතයෙන් වැළකීම
   (ii) ජීවිත අවදානම

*B* – (i) මත්පැන් පානය
   (ii) පවුල් විසංවිධානය වීමේ අවදානම

*C* – (i) බොරුකීම
   (ii) අසත්‍ය තොරතුරු පැතිරීමේ අවදානම

*D* – (i) අන් සතු දේ නොගැනීම
   (ii) දේපළ ආරක්ෂා කර ගැනීමේ අවදානම

31. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි අඩුවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක කුමක් ද?
   (1) *A* හා *B*
   (2) *A* හා *C*
   (3) *A* හා *D*
   (4) *B* හා *C*

32. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
   (1) *A* හා *C* ය.
   (2) *A* හා *D* ය.
   (3) *B* හා *C* ය.
   (4) *B* හා *D* ය.

[ 6 වැනි පිටුව බලන්න.

● පහත සඳහන් ප්‍රකාශ අධ්‍යයනය කරන්න.

*A* – ඒඩ්ස් රෝගය බරපතල සමාජ ගැටලුවකි.

*B* – ඒඩ්ස් රෝගකාරක වෛරසය මගින් මානව ප්‍රතිශක්තිකරණය ඌනතාවට පත් කරයි.

*C* – ඒඩ්ස් රෝගයට ගොදුරු වන්නේ තරුණ තරුණියන් පමණි.

*D* – ඒඩ්ස් රෝගය මාරාන්තිකය.

33. ඉහත ප්‍රකාශ අතුරින් ඒඩ්ස් රෝගය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) *A, B* හා *C* (2) *A, B* හා *D* (3) *A, C* හා *D* (4) *B, C* හා *D*

● පහත සඳහන් කරුණු අධ්‍යයනය කරන්න.

*A* – බලාපොරොත්තු බිඳ වැටීම

*B* – අසීමිත ආශාවන් පාලනය කර ගත හැකි වීම

*C* – දරා ගැනීමේ ශක්තිය නොමැති වීම

*D* – ජීවිතයක වටිනාකම පිළිබඳ අනවබෝධය

34. ඉහත කරුණු අතුරින් ශ්‍රී ලංකාව තුළ සියදිවි හානිකර ගැනීමට බලපාන කරුණු දැක්වෙන වරණය කුමක් ද?
(1) *A, B* හා *C* (2) *A, B* හා *D* (3) *A, C* හා *D* (4) *B, C* හා *D*

35. පර්යේෂණයක් ලෙස හැඳින්වෙන්නේ,
(1) පරිස්සම් සහගත අධ්‍යයනයක් මාර්ගයෙන් නව දැනුම හා ඊට පදනම් වන හේතු සාධක සොයා බැලීමයි.
(2) තොරතුරු එක්රැස් කිරීමයි.
(3) එක් තැනක ඇති තොරතුරු තවත් තැනකට ගෙනයාමයි.
(4) යම් විෂයක් හෝ මාතෘකාවක් හා සම්බන්ධ තොරතුරු අවුස්සා බැලීමයි.

36. තෝරාගත් ගැටලුවකට අදාළ හේතුසාධක පිළිබඳ කල්පිත ගොඩනගා ගැනීම හා ඒවායේ සත්‍ය අසත්‍යතාව සොයා බැලීම පර්යේෂණ ක්‍රියාවලියයි. එලෙස ගොඩනගා ගත් කල්පිත, පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) තොරතුරු (2) උපන්‍යාස (3) මතවාද (4) දත්ත

37. පර්යේෂකයා ද නිරීක්ෂණයට ලක් කරනු ලබන සමාජයේ කොටස්කරුවකු බවට පත් වී එහි සාමාජිකයාට නොදැනෙන ලෙස තොරතුරු එක් රැස් කිරීමේ නිරීක්ෂණ ප්‍රභේදය හඳුන්වනු ලබන්නේ,
(1) සහභාගිත්ව නිරීක්ෂණය ලෙස ය. (2) වක්‍ර නිරීක්ෂණය ලෙස ය.
(3) ක්ෂේත්‍ර නිරීක්ෂණය ලෙස ය. (4) සෘජු නිරීක්ෂණය ලෙස ය.

● පහත සඳහන් සිද්ධිය ඇසුරින් **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසුන්ගේ සිංහල භාෂා කුසලතා පිළිබඳ අධ්‍යයනයක් කිරීමට කටයුතු කළ නන්ද හිමියන් අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

✻ සිසුන්ගේ අභ්‍යාස පොත්, ලිඛිත නිර්මාණ, පසුගිය වාර පරීක්ෂණවල පිළිතුරු පත්‍ර ආදී මූලික ලේඛන වාර්තා පරීක්ෂා කිරීම

✻ පර්යේෂණ ක්‍රියාකාරකම් හා ඒවා කිරීමට අපේක්ෂිත කාලවකවානු දැක්වෙන වගුවක් පිළියෙළ කිරීම

✻ නියැදියේ සිසුන් සමග මුහුණට මුහුණලා කරනු ලබන අන්තර් ක්‍රියා මගින් දත්ත රැස්කර ගැනීම

38. මෙහිදී නන්ද හිමියන් සිසුන් සම්බන්ධ මූලික ලේඛන පරීක්ෂා කිරීමෙන් හඳුනා ගැනීමට උත්සාහ කර ඇත්තේ,
(1) පර්යේෂණ ගැටලුවට විසඳුම් සෙවීම ය. (2) පර්යේෂණ නියැදිය හඳුනා ගැනීම ය.
(3) පර්යේෂණ යෝජනාව සකස් කිරීම ය. (4) පර්යේෂණ ගැටලු හඳුනා ගැනීම ය.

39. මෙහි දැක්වෙන පරිදි නියැදියේ සිසුන්ගෙන් දත්ත එක් රැස් කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) ප්‍රශ්නාවලි (2) නිරීක්ෂණ (3) සම්මුඛ සාකච්ඡා (4) පරීක්ෂණ

40. නන්ද හිමියන් සකස් කළ පර්යේෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ කාලවකවානු දැක්වෙන වගුව කුමන නමකින් හැඳින්වේ ද?
(1) දත්ත විශ්ලේෂණ වගුව (2) පර්යේෂණ පිරිසැලසුම
(3) ක්‍රියාකාරකම් වගුව (4) කාල රාමුව

✻✻

[ 7 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம / Department of Examinations, Sri Lanka

**NEW** **2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්** **08 S I,II**

**(නව නිර්දේශය)**

**(08) සමාජ විද්‍යාව - I, II**

**සමාජ විද්‍යාව - II පත්‍රය**

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) සමාජීය විද්‍යා ඇසුරෙන් ගොඩනැගී ඇති උපවිෂය ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(ii) යමක් පිළිබඳව තීරණ ගැනීමේ දී විවිධ සාධක පිළිබඳ සොයාබලා තර්කානුකූලව ක්‍රියා කළ යුතු බව දැක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

(iii) හර්බට් ස්පෙන්සර් පෙන්වා දී ඇති සමාජ පරිණාමයේ අදියර දෙක සඳහන් කරන්න.

(iv) සංස්කෘතික සත්ත්වයකු බවට පත්වීමෙන් මිනිසාට ලද හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(v) පවුල් සමූහය මගින් මෙරට සමාජයේ අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන වැදගත් සේවාවන් දෙකක් සඳහන් කරන්න.

(vi) වරදකරුවන් බන්ධනාගාරගත කිරීමේ ප්‍රධාන අරමුණු දෙක සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවර්ග දෙකක් දක්වා ඔවුන් විසින් වාර්ෂිකව සමරනු ලබන සංස්කෘතික උත්සව එක බැගින් සඳහන් කරන්න.

(viii) පර්යේෂණයක දී අනුගමනය කරනු ලබන කාල රාමුවක ඇතුළත් වන ප්‍රධාන අංග දෙක සඳහන් කරන්න.

(ix) දත්ත රැස් කිරීමේ උපකරණවල තිබිය යුතු ප්‍රධාන ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(x) මත්ද්‍රව්‍ය භාවිතය මගින් ඇති විය හැකි සමාජ ගැටලු දෙකක් සඳහන් කරන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** (i) සමාජ විද්‍යාව යනු කුමක්දැයි අර්ථකථනය කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා මැක්ස් වේබර්ගෙන් සිදු වූ සේවාවන් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) සමාජ විද්‍යාව හැදෑරීමෙන් භික්ෂූන් වහන්සේට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) සමාජ වෙනස්වීම් සඳහා කාර්මීකරණයෙන් සිදු වූ බලපෑම් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) නවීකරණයේ ප්‍රධාන අංග තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා පාලකයන් විසින් අනුගමනය කළ යුතු බෞද්ධ ඉගැන්වීම් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) 'සංස්කෘතිය' යන්න ඔබ අර්ථකථනය කරන්නේ කවර ආකාරයට ද? *(ලකුණු 02 යි)*

(ii) ඔබ අවට සමාජයේ හමුවන උප සංස්කෘති තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) වේගයෙන් පැතිර යන බටහිරකරණය සිංහල සංස්කෘතියට බලපාන ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

**5.** (i) ශ්‍රී ලංකාවේ වඩාත් පූජනීයත්වයට පත්වන දෙවිවරුන් දෙදෙනෙකු නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ශ්‍රී ලංකා සමාජය පරිණාමයේ දී පසු කරනු ලැබූ ප්‍රධාන රාජ්‍ය පාලන අවධි තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) මහින්දාගමනයෙන් පසු ලංකා සමාජයේ දියුණුව පිළිබිඹු වන සාධක දෙකක් දක්වා ඒවා පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) සමාජ පාලන ප්‍රභේද දෙක සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) නූතන සමාජය සඳහා සමාජ පාලනය වැදගත්වීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) සමාජ පාලනය සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) කිසියම් ක්‍රියාවක් අපරාධයක් වීම සඳහා සම්පූර්ණ විය යුතු මූලික කොන්දේසි දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සමාජ ගැටලුවක් හඳුනා ගැනීමේ දී ඉවහල් කර ගත හැකි මූලික ලක්ෂණ අතුරින් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ජනවර්ග අතර ගැටුම් ඇතිවීම කෙරෙහි ඉවහල් වන හේතු දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**8.** (i) 'සමාජ විද්‍යා පර්යේෂණයක්' යනු කුමක්දැයි අර්ථකථනය කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී තොරතුරු රැස් කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන විධික්‍රම තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී අනුගමනය කළ යුතු පියවර අතුරින් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

***